9 බුද්ධකාරකධර්ම හඳුනා ගනිමු

බුද්ධකාරකධර්ම නම් බුදුබවට පත් වීම සඳහා පුහුණු කළයුතු ගුණ ධර්ම යි. පාරමී, පාරමිතා යනුවෙන් ද ඒවා හැඳින් වෙයි. ගුණ නැණ දියුණුවේ ඉහළ ම කෙළවර බුද්ධත්වය යි. බුද්ධත්වය යන්නෙන් සම්මා සම්බුද්ධ වීම, පසේබුදු වීම හා මහරහත් වීම යන උතුම් තත්ත්ව තුන ම අදහස් කෙරේ. එම උතුම් තත්ත්වය හෙවත් බුද්ධත්වය පරම නම් වේ. පරම තත්ත්වයට පත්වීමට උපකාර වන ධර්ම සමූහය පාරමිතා යි. සංසාර සාගරයෙන් එතෙරට යෑමට උපකාරවන ධර්ම යන තේරුමෙන් ද 'පාරමිතා' යයි කියනු ලැබේ. ඒවා දහයකි.

එම දසය පිළිවෙළින් දාන, සීල, නෙක්ඛම්ම, පඤ්ඤා, විරිය, ඛන්ති, සච්ච, අධිට්ඨාන, මෙත්තා හා උපේක්ඛා යනු වේ.

පෞද්ගලික ලාභ ප්‍රයෝජන කීර්ති ප්‍රශංසා ආදිය බලාපොරොත්තු නොවී බුදුවීම හෝ පසේබුදු වීම හෝ රහත් වීම හෝ අරමුණු කර ගෙන ඊට අවශ්‍ය ගුණ ධර්ම පුහුණු කිරීමක් වශයෙන් දන් දීම සිල් රැකීම ආදිය කරන විට පාරමිතා ගණයට වැටේ. කෙසේ හෝ දන් දුන් තරමින්, සිල්සමාදන් වූ තරමින් ඒවා පාරමිතාවන් නොවේ. පාරමිතාවක් වීමට තිබිය යුතු ප්‍රධාන ලක්ෂණ පහක් දක් වේ. ඒවා නම් තෘෂ්ණාවෙන් තොරබව, මානයෙන් තොරබව, වැරැදි දෘෂ්ටියෙන් තොරබව, කරුණාවෙන් යුක්තබව සහ උපාය කුසලතාවෙන් හෙවත් නුවණින් යුක්තබවයි.

> තණ්හාමානදිට්ඨීහි අනුපහතා කරුණූපායකොසල්ල පරිග්ගහිතා
> දනාදයො ගුණා පාරමියො
>
> චරියා පිටක අටුවාව

යම් තැනැත්තකු දානයක් දෙන්නේ දිව්‍යලෝක මනුෂ්‍යලෝක සම්පත් ලබා ගැනීමේ ආශාව පෙරදැරි කර ගෙන නම්, කීර්තියට ප්‍රශංසාවට ආශාවෙන් නම් ඔහුගේ දානය තෘෂ්ණාවෙන් මිශ්‍ර වී ඇත. දන් දෙන අනෙකුත් අයට වඩා කැපී පෙනෙන අදහස් ඇති ව හෝ තම වත්පොහොසත්කම පෙන්වීම සඳහා හෝ දීමේ දී එම දානය මානයෙන් මිශ්‍ර වී ඇත. අනෙක් ගුණ දහම්, භාවනාදිය නො සලකා හැර දානයෙන් පමණක් විමුක්තිය ලබා ගත හැකි ය යන අදහස මත දෙන දානය දෘෂ්ටියෙන් මිශ්‍ර වී ඇත. එබඳු ලක්ෂණවලින් තොර ව, අනුන්ගේ ප්‍රයෝජනය සඳහා දන් දීම මගේ යුතුකමකි, බුද්ධත්වයට පත් වීමට නම් අනිවාර්යයෙන් ම දන් දිය යුතු ය යන පිළිගැනීම ඇති ව දෙන විට එය පාරමිතාවක් වේ.

දනය කරුණාවෙන් මිශ්‍ර වීමට නම් ලබන තැනැත්තන් හෙවත් ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි දයාව අනුකම්පාව ඇතුව ම දිය යුතු ය. දනයේ ආනිසංස ගැන අවබෝධයක් ඇති ව වඩා හොඳින් සකස් ව දීමේ දී එම දනය උපාය කුසලතාවෙන් හෙවත් නුවණින් යුක්ත වේ. ශීලාදි ගුණධර්ම පිරීමේ දී ද ඉහත සඳහන් ලක්ෂණයන්ගෙන් යුක්ත වූ විට ඒවා පාරමිතා ගණයට ඇතුළත් වේ.

පාරමිතාවන්ගේ ප්‍රධාන ලක්ෂණය වන්නේ ආත්මාර්ථයට වඩා පරාර්ථය ගැන සැලකිලිමත් වීම යි. එ නම් තමා කරන කියන දෙයින් තමන්ට සැලසෙන ප්‍රයෝජනයට වඩා අනුන්ට සැලසෙන සෙත ගැන සැලකිලිමත් වීම යි. පාරමිතා පුරන බෝසතාණන් වහන්සේ තමන්ගේ කාලය, ශ්‍රමය, බුද්ධිය, ධනය, සැප පහසුකම් ආදී සියල්ල ම අන්‍යයාගේ සැපත සඳහා යොදවති. දීර්ඝ කාලයක් එ සේ කිරීම නිසා ඕනෑ ම දෙයක් අත්හැරීමේ හැකියාව ඇති වේ. සිල්වත්කමින් ඉහළ මට්ටමට පැමිණේ. වීර්යය, ඉවසීමේ ශක්තිය, අධිෂ්ඨාන ශක්තිය ආදියෙන් ද උසස් ම තත්වයකට පත් වේ. ජීවිතය හා ලෝකය පිළිබඳ නියම තත්වය අවබෝධ කර ගැනීමට සමත් වන තරමට ප්‍රඥව දියුණු වේ. ඒ ගුණදහම් සියල්ලෙහි ම උපරිම මට්මටමට පත්වීම බුද්ධත්වය යි.

පාරමී ධර්ම පුරන ආකාරය අනුව සෑම පාරමිතාවක් ම කොටස් තුනකට බෙදේ.

1. පාරමී
2. උපපාරමී
3. පරමත්ථ පාරමී

දාන, ශීලාදි ගුණධර්ම පුහුණු කිරීමේ දී තමන්ගේ ගේදොර, ඉඩකඩම්, මිලමුදල් ආදියට හානි පැමිණියත් කිසිදු කම්පාවකින් තොර ව ද, ඒවා අවශ්‍ය විට පරිත්‍යාග කරමින් ද එම ගුණදහම්හි යෙදීම පාරමී නම් වේ. බාහිර වස්තු පමණක් නොව අත් පා ආදී ශරීරාංග ද පරිත්‍යාග කරමින්, ශීලාදී ගුණධර්ම වෙනුවෙන් ශරීරාංගයක් නැතිකර ගැනීමට වුව ද ඉදිරිපත් වෙමින් එම ගුණදහම් පුරන විට උපපාරමී නම් වේ. පරමත්ථ පාරමී නම් ජීවිතය ද කැප කරමින් පෙරුම්දම් පිරීමයි. පාරමී තත්ත්වය සම්පූර්ණ කිරීමෙන් රහත් භාවයට ද පාරමී සහ උපපාරමී තත්ත්වය සම්පූර්ණ කිරීමෙන් පසේබුදු පදවියට ද, පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී සම්පූර්ණ කිරීමෙන් සම්මා සම්බුද්ධත්වයට ද පත් විය හැකි බව සඳහන් වේ. නිර්වාණාවබෝධය අපේක්ෂා කරන සෑම කෙනකු ම මෙම දානාදී ගුණධර්ම ටිකින් ටික දියුණු කර ගත යුතු වේ. එමෙන්ම, එම ගුණදහම් සමාජගත ජීවිතයට වැදගත්වන බැවිනුත් ඒවා ගැන දැන ගැනීම ප්‍රයෝජනවත් වේ.

දාන පාරමිතා

තමන්ට අයත් දෙයක් පූජාවක් වශයෙන් හෝ අනුග්‍රහයක් වශයෙන් හෝ දීම දනය යි. සීලාදියෙන් තමාට වඩා උසස් අයට ගෞරවයෙන් යුක්ත ව දීම පූජාවකි. කෙනකුගේ අසරණකම ආදිය සැලකිල්ලට ගෙන ඔහුට උපකාරයක් වශයෙන් කරුණාවෙන් අනුකම්පාවෙන් කරන දීම අනුග්‍රහයක් ලෙස දීමකි.

බාහිර වස්තු පමණක් නොව, ඇස්, වකුගඩු, ලේ වැනි ශාරීරික කොටස් පරිත්‍යාග කිරීම, මුළු ජීවිතය ම පරිත්‍යාග කිරීම, අනුන් මරණින් ගලවා ගැනීම හා ඔවුන්ගේ මරණ බිය දුරු කිරීම, වෙහෙස මහන්සි නොබලා ධර්මය කියා දීම ආදිය ද දනයට අයත් වේ. ශාරීරික කොටස් වෙන් කර නොදුන්නත් පෞද්ගලික ලාභ ප්‍රයෝජන අපේක්ෂා නොකර, තම ශ්‍රමය ධනය ආදිය යොදවමින් සමාජ සේවයෙහි යෙදීම ද අයත් වන්නේ දනයට ය.

වෙස්සන්තර ජාතකයෙන්

කවර ආකාරයේ දීමක් වුව ද බුදුබව හෝ පසේබුදුබව හෝ අර්හත්වය හෝ නිවන හෝ ප්‍රාර්ථනා කරමින් සිදු කරන කල දන පාරමිතා නම් වේ. අප මහබෝසතාණන් වහන්සේ දන පාරමිතාව පිරූ ආකාරය **වෙස්සන්තර** වැනි ජාතක කතාවලින් පැහැදිලි වෙයි.

කරුණුපායකොසල්ල පරිග්ගහිතා අත්තුපකරණ පරිච්චාග චේතනා දාන පාරමිතා

චරියාපිටක අටුවාව

- පුත්‍රදාර ධනාදී බාහිර දෑ පරිත්‍යාග කිරීම දාන පාරමිතාවයි.
- ශරීරාවයව පරිත්‍යාගය දාන උපපාරමිතාවයි.
- ජීවිතය ම පරිත්‍යාග කිරීම දාන පරමත්ථ පාරමිතාවයි.

සීල පාරමිතා

තුන්තරා බෝධියෙන් එකක් හෝ නිවන ප්‍රාර්ථනා කර ගෙන සිල් රැකීම සීල පාරමිතාව යි.

සීලය නම් කය, වචන දෙකේ සංවරය යි. එ නම් නරක වැඩ නොකර හොඳ වැඩ කිරීම යි. නරක වචන කථා නොකර හොඳ වචන කථා කිරීම යි. සතුන් මැරීමෙන් වැළකී සතුන්ට දයාව අනුකම්පාව දැක්වීම සිල්වත් වීමකි.

කේලාම් කියා ඔවුනොවුන් අසමඟි කිරීමෙන් වැළකී, සමඟි කරවන වචන කථා කිරීම සිල්වත් වීමකි. තමන් ප්‍රාණඝාතය නො කිරීම, අනුන් ලවා නො කරවීම, කරන්නන්ට අනුබල නො දීම යන ලක්ෂණ මෙන් ම, තමන් වැළකීම, අනුන් වැළැක්වීම, වැළැකීමේ ආනිශංස කියා දීම යන ලක්ෂණ ද උසස් සිල්වතකු තුළ ඇත. එ බඳු උතුම් ලක්ෂණ පවතින්නේ උසස් පුද්ගලයකු තුළ ය. එ බැවින් සීලය නම් උතුම් පුද්ගලයකු තුළ පැවැතිය යුතු ස්වභාවය යි. එම ස්වභාවය ඇති කර ගැනීමට සහ රැක ගැනීමට විවිධ ක්‍රම භාවිත කරනු ලැබේ. පන්සිල්, අටසිල්, ආජීවාෂ්ටමක සිල් ආදී වශයෙන් ශික්ෂාපද සමාදන් වීම එ බඳු ක්‍රමයකි. ලාභයක් සඳහා හෝ අලාභයකින් වැළකීමට ඒ ශික්ෂාපද කඩ නොකිරීම සීල පාරමිතාව පුරන තැනැත්තා ගේ ලක්ෂණය යි. එක් ඇසක් ඇති තැනැත්තකු ඒ ඇස ඉතා සැලකිල්ලෙන් ආරක්ෂා කර ගන්නාක් මෙන්, එක ම පුතකු ඇති මවක විසින් එම පුතා රැකගනු ලබන්නාක් මෙන් හෙතෙම සීලය ආරක්ෂා කර ගනී. **සීල වීමංස ජාතකය,** මහබෝසතාණන් වහන්සේ සීල පාරමිතාව පිරූ ආකාරය දැක්වෙන්නකි.

කරුණූපාය කොසල්ල පරිග්ගහිතං කායවචී සුචරිතං අත්ථතො අකත්තබ්බ විරති කත්තබ්බ කරණ චේතනාදයො ච සීල පාරමිතා

චරියාපිටක අටුවාව

- අඹුදරුවන් නිසාවත් වස්තුව නිසාවත් සීලය කඩ නොකර රැකීම සීල පාරමිතාවයි.
- තම ශරීරාවයවයන් වුවද පරිත්‍යාග කොට සිල් රැකීම සීල උපපාරමිතාවයි.
- ජීවිත පරිත්‍යාගයෙන් රක්නා වූ සීලය සීල පරමත්ථ පාරමිතාව යි.

නෙක්ඛම්ම පාරමිතා

රූප ශබ්ද ආදී අරමුණු ලබමින් ඇස, කන ආදී ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාවෙන් ඉවත් වීමේ ප්‍රතිපදාව නෙක්ඛම්ම පාරමිතාව යි.

අපේ ඇසට හමුවන ලස්සන රූපවලට අපි ආශා කරමු. ඒවායේ ඇලීම අපේ ස්වභාවය යි. කනට ඇසෙන මිහිරි ශබ්දවලට, නාසයට දැනෙන සුවඳට, අපි ආශා කරමු. ඒවායේ ඇලෙමු. මේ ඇලීම නිසා විවිධ කරදරවලට, අසහනයන්ට භාජනය වීමට සිදු වේ. එම ආශාවන් පාලනය නොකර, ඒවායින් ඉවත් නොවී දියුණු වීමට ද නිවන් දැකීමට ද නොහැකි ය.

ඒ බව තේරුම් ගෙන රූප ශබ්ද ආදියෙන් ඇස, කන ආදී ඉන්ද්‍රියයන් පිනවීමට ඇති ආශාව පාලනය කිරීමට සහ අතහැර දැමීමට අවංක ව ක්‍රියා කිරීමෙන් නෙක්ඛම්ම පාරමිතාව සම්පූර්ණ වේ. මඛාදේව ජාතකයේ දැක්වෙන්නේ බෝසතාණන් වහන්සේ මෙම පාරමිතාව ප්‍රගුණ කළ ආකාරයයි.

කරුණුපාය කොසල්ල පරිග්ගහිතො ආදීනව දස්සන පුබ්බංගමෝ කාම භවෙහි නික්ඛමණ චිත්තුප්පාදො නෙක්ඛම්ම පාරමිතා

චරියාපිටක අටුවාව

- බාහිර වස්තු හා අඹු දරුවන් අත්හැරීම නෙක්ඛම්ම පාරමිතාවයි.
- ශරීරාවයව නැති වුනත් කාමයන්ගෙන් වෙන් වී සිටීම නෙක්ඛම්ම උප පාරමිතාවයි.
- ජීවිතයට හානියක් වුව ද කම්සැප විඳීමට නොපැමිණීම නෙක්ඛම්ම පරමත්ථ පාරමිතාවයි.

ප්‍රඥා පාරමිතා

බුද්ධත්වය ප්‍රාර්ථනා කර ගෙන නුවණ දියුණු වන ක්‍රියාකාරකම්වල යෙදීම ප්‍රඥා පාරමිතාව යි. පින් පව්, හොඳ නරක, කුසල් අකුසල් දැන ගැනීමට දියුණු නුවණක් අවශ්‍ය ය. ලෝකය අස්ථිර බව, දුක් සහිත බව ආදිය දැන ගත හැක්කේ නුවණ තියුණු වූ විට ය. යෝනිසෝ මනසිකාරයෙන් හෙවත් බුද්ධිමත් ව සිතා බලමින් විවිධ ගැටලු නිරාකරණය කිරීමට ප්‍රයත්න දැරීම ආදිය නිසා නුවණ දියුණු වේ. බණ ඇසීම, සාකච්ඡා කිරීම, ප්‍රශ්න කිරීම, තර්ක කිරීම ආදිය නිසා නුවණ දියුණු වේ. උම්මග්ග ජාතකය බෝසතුන් ප්‍රඥා පාරමිතාව පිරූ ආකාරය පැහැදිලි කරන්නකි.



උම්මග්ග ජාතකයෙන්

කරුණූපාය කොසල්ල පරිග්ගහිතො ධම්මානං සාමඤ්ඤ විසේස ලක්ඛණාවබොධො පඤ්ඤා පාරමිතා

චරියාපිටක අටුවාව

- තම බාහිර වස්තු කෙරෙහි බැඳීම් නැති ව ප්‍රඥාව දියුණු කිරීම සහ ප්‍රඥාවෙන් සේවය කිරීම ප්‍රඥා පාරමිතාවයි.
- ශරීරාංග ගැන නො සලකා ප්‍රඥා වර්ධන ක්‍රියාවන්හි නිරත වීම සහ ප්‍රඥාවෙන් සෙත සැලසීම ප්‍රඥා උපපාරමිතාවයි.
- ජීවිතයට පැමිණිය හැකි හානි ගැන නො සලකා ප්‍රඥා වර්ධන ක්‍රියාවන්හි නිරත වීම සහ ප්‍රඥාවෙන් සෙත සැලසීම ප්‍රඥා පරමත්ථ පාරමිතාවයි.

වීර්ය පාරමිතා

වීර්ය පාරමිතාව නම් බුද්ධත්වය අරමුණු කරගෙන දන්දීම, සිල් රැකීම, අනුන්ට සෙත සැලසීම ආදිය සඳහා ඥානවන්ත ලෙස උත්සාහ කිරීම යි. පසු බැසීමට හේතු වන කුමක් ඉදිරිපත් වුව ද ඒ එකකින් වත් මන්දෝත්සාහී නොවී කටයුතු ඇරඹීමටත්, ඇරඹි කටයුතු නො නවත්වා ඉදිරියට කර ගෙන යාමටත් බලවත් ලෙස ප්‍රයත්න දැරීම වීර්ය පාරමිතාවේ ස්වභාවය යි. එය තමන්ගේත් අනුන්ගේත් අභිවෘද්ධිය සඳහා ගන්නා බලවත් උත්සාහය යි. ඕනෑම උත්සාහයක පියවර තුනක් ඇත.

ආරම්භ ධාතු	→	ආරම්භයේ දී ඇති කර ගත යුතු වීර්ය ය.
නික්ඛම ධාතු	→	ඉදිරිපත් වීමේ දී ඇති කර ගත යුතු වීර්ය ය.
පරක්කම ධාතු	→	නිරත වීමේ දී ඇති කර ගත යුතු වීර්ය ය.

බෝසත්වරු මෙම තෙවැදෑරුම් වීර්යය උපදවා ගෙන වීර්ය පාරමිතාව පුරති. අපේ එදිනෙදා කටයුතු සාර්ථක කර ගැනීමට ද මෙය බෙහෙවින් උපකාරී වේ. **වණ්ණුපථ ජාතකය** බෝසතුන්ගේ වීර්ය පාරමිතාවට නිදසුනකි.

කරුණූපාය කොසල්ල පරිග්ගහිතො කායචිත්තෙහි පරහිතාරම්භො විරිය පාරමිතා

චරියාපිටක අටුවාව

- බුද්ධත්වය සඳහා වූ වීර්යය බාහිර වස්තුවලට ආශාවෙන් අත් නොහරින විට එය වීර්ය පාරමිතාවයි.
- ශරීරාංගවලට හානි පැමිණියත් අත් නොහරින වීර්යය, වීර්ය උප පාරමිතාවයි.
- ජීවිත පරිත්‍යාගයෙන් වීර්ය කිරීම වීර්ය පරමත්ථ පාරමිතාවයි.

ක්ෂාන්ති පාරමිතා

ඛන්ති හෙවත් ක්ෂාන්ති නම් ඉවසීම යි. ඉවසීම පුරුදු කිරීම ක්ෂාන්ති පාරමිතාව යි. කුසගින්න, පිපාසය, ලෙඩරෝග ආදියෙන් ඇති වන පීඩා, ශීතල හා උණුසුම නිසා ඇති වන පීඩා, විරුද්ධවාදීන්ගෙන් ඇති වන හිරිහැර ආදිය ඉවසීම මෙයට ඇතුළත් වේ. ඒවා ඉවසිය නො හැකි වුව හොත් තමා පුරුදු පුහුණු කරන කිසි ම පිළිවෙතක් දිගට පවත්වා ගැනීම අපහසු ය. පරාර්ථ සේවය කළ හැකි ද නො වේ. අප මහබෝසතාණන් වහන්සේ ගේ ක්ෂාන්ති පාරමිතාව මතු කර පෙන්වන්නකි **ක්ෂාන්තිවාදී ජාතකය.**

කරුණූපාය කොසල්ල පරිග්ගහිතං සත්ත සංඛාරාපරාධ සහනං අදොසප්පධානො තදාකාරප්පවත්තො චිතිතුප්පාදො ඛන්ති පාරමිතා

චරියාපිටක අටුවාව

- බාහිර වස්තුවලට වන හානි නොසලකා ඉවසීම ක්ෂාන්ති පාරමිතාවයි.
- ශාරීරික අංගවලට සිදු වන හානි ගැන නො සලකා ඉවසීම ක්ෂාන්ති උපපාරමිතාවයි.
- ජීවිතයට හානි සිදු වෙද්දීත් ඉවසීමෙන් තොර නොවීම ක්ෂාන්ති පරමත්ථ පාරමිතාවයි.

සත්‍ය පාරමිතා

සත්‍යවාදීභාවය පුහුණු කිරීම සත්‍ය පාරමිතාව යි. සත්‍යවාදීභාවය නම් කිසිවකු නොරවටන, මුළා නොකරන බව යි. එය සියලු ම ගුණයන්ට ආධාර වන්නකි. බොරු නොකීම සහ ඇත්ත කීම පමණක් නොව පොරොන්දු කඩ නොකිරීම, අවංක වීම ආදිය ද මෙ ම පාරමිතාවට අයත් ය. එ බැවින් එහි ආකාර තුනක් දක්වා ඇත.

- වාග් දුශ්චරිතයෙන් වැළැකීම
- පොරොන්දු කඩ නොකිරීම
- ඇත්ත කීම

සත්‍යය කීම මෙන් ම සත්‍යයෙහි පිහිටීම ද සත්‍ය පාරමිතාවට අයත් වේ. **වට්ටක ජාතකය** සත්‍ය පාරමිතාවට නිදසුනකි.

කරුණුපාය කොසල්ල පරිග්ගහිතං විරති චෙතනාදි භෙදං අවිසංවාදනං සච්ච පාරමිතා

චරියාපිටක අටුවාව

අධිෂ්ඨාන පාරමිතාව

තමා පිළිපදින යහපත් පිළිවෙත් කවර හේතුවක් නිසාවත් කඩ නොකිරීමටත්, අයහපත් දේ නො කිරීමටත් ඇති කර ගන්නා අධිෂ්ඨානය පවත්වා ගැනීම අධිෂ්ඨාන පාරමිතාව යි. ඒ සඳහා වීර්යය, ඉවසීම, සත්‍යවාදී වීම ආදිය ද අවශ්‍ය ය. අධිෂ්ඨානය නැති අයට පාරමිතා සම්පූර්ණ කළ නොහැකි ය. එ බැවින් අධිෂ්ඨාන පාරමිතාව අනෙකුත් පාරමිතාවන් සමඟ ද බැඳී පවතී. අධිෂ්ඨානය බුදුබව ලැබීමට පමණක් නොව අපේ ඉගෙනීමාදිය සාර්ථක කර ගැනීමට ද අවශ්‍ය ය.' මට මෙය කළ හැකි ය. මම මෙය කෙසේ හෝ ඉටුකර ගනිමි' යි යන චිත්ත ශක්තිය නැති ව කිසිදු ජයග්‍රහණයක් ලබා ගත නොහැකි ය. බෝසතාණන් වහන්සේ අධිෂ්ඨාන පාරමිතාව පිරූ ආකාරය **තේමිය ජාතකයෙන්** ප්‍රකට වේ.

කරුණුපාය කොසල්ල පරිග්ගහිතං අචලසමාදානාධිට්ඨානං තදාකාරප්පවත්තො චිත්තුප්පාදො අධිට්ඨාන පාරමිතා

චරියාපිටක අටුවාව

- බාහිර වස්තුවලට හානි පැමිණියත් අධිෂ්ඨානය අත් නොහරින විට අධිෂ්ඨාන පාරමිතාවයි.
- ශාරීරික අංගවලට හානි පැමිණියත් අධිෂ්ඨානය අත් නොහරින විට අධිෂ්ඨාන උපපාරමිතාවයි.
- ජීවිත හානි සිදු වුවත් අධිෂ්ඨානයෙන් ක්‍රියා කරන විට අධිෂ්ඨාන පරමත්ථ පාරමිතාවයි.

මෛත්‍රී පාරමිතාව

මෛත්‍රිය නම් මිත්‍රත්වය යි. හිතවත්කම යි. සම්බෝධිය අරමුණු කර ගෙන, සතුරු මිතුරු ආදී කිසිදු භේදයකින් තොර ව සැම දෙනා සමඟ ම මිත්‍රත්වය පැවැත්වීම, ඒ සඳහා අවශ්‍ය ඕනෑ ම කැප කිරීමක් කිරීම මෛත්‍රී පාරමිතාව යි. එ නම් කිසිවකු කෙරෙහි වෛරයක් ද්වේෂයක් ඇති නො වීමට සිත පුරුදු කිරීම යි.

- තම දේපළවලට හානි කරන, තම පිරිසට හිරිහැර කරන අයට පවා නො කිපී මෙත් වැඩීම මෛත්‍රී පාරමිතාවයි.
- තම ශරීරයේ අඟ පසඟවලට හානි කරන අයට පවා නො කිපී මෙත් වැඩීම මෛත්‍රී උපපාරමිතාවයි.
- තම ජීවිතයට හානි කරන්නන් කෙරෙහි ද නො කිපී මෙත් වැඩීම මෛත්‍රී පරමත්ථ පාරමිතාවයි.

බෝසතාණන් මෛත්‍රිය පැතිර වූ ආකාරය මස මානවක ජාතකයෙහි දක්නට ලැබේ.

කරුණූපාය කොසල්ල පරිග්ගහිතො ලොකස්ස හිතසුඛූපසංහාරො අත්ථතො අව්‍යාපාදො මෙත්තා පාරමිතා

චරියාපිටක අටුවාව

උපේක්ෂා පාරමිතාව

උපේක්ෂාව නම් මැදහත්බව යි. එ නම් කිසි ම පුද්ගලයකු හෝ වස්තුවක් හෝ සිද්ධියක් සමඟ විශේෂ ඇල්මක් හෝ ඒවාට අමුතු පිළිකුලක් හෝ ඇති කර නොගෙන සම සිත පැවැත්වීම යි. එය පුරුදු කිරීම උපේක්ෂා පාරමිතාව යි. උදාසීනකම හෝ කිසිවක් ගණන් නොගන්නා ගතිය උපේක්ෂාව නො වේ. බුද්ධිමත් ව සිතා බලා, ඇලීම් ගැටීම් දෙකින් තොර වීම යි උපේක්ෂාව. අෂ්ට ලෝක ධර්මයට මැදහත් ව මුහුණ දීම ද මෙයට ඇතුළත් ය.

- තම ධනය ගැනත් තම පිරිස ගැනත්, තම ධනයට සහ පිරිසට හිත අහිත පුද්ගලයන් ගැනත් මධ්‍යස්ථ වීම උපේක්ෂා පාරමිතාවයි.
- තම ශරීරාවයවවලට හානි කරන අයටත් ඒවා සුවපත් කර ගැනීමට උපකාර කරන අයටත් මධ්‍යස්ථ වීම උපේක්ෂා උපපාරමිතාවයි.
- තම දිවි රැකීමට ඉදිරිපත් වන අය කෙරෙහිත් තමා මැරීමට එන අය කෙරෙහිත් මධ්‍යස්ථ වීම උපේක්ෂා පරමත්ථ පාරමිතාවයි.

උපේක්ෂා පාරමිතාව ප්‍රකට වන ජාතක කථාවකි **ලෝමහංස ජාතකය.**

කරුණාපාය කොසල්ල පරිග්ගහිතා අනුනය පටිසවිද්ධංසනී ඉට්ඨානිට්ඨේසු සත්ත සංඛාරෙසු සම්පවත්ති උපේක්ඛා පාරමිතා

චරියාපිටක අටුවාව

මෙම සියලු පාරමිතා අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකට සම්බන්ධ ය. ඒවා පිරීම නිසා පුද්ගලයා තුළ මනා සංවර්ධනයක් ඇති වේ. එ සේ ම ඔහුගෙන් බලවත් පරාර්ථ සේවයක් ද සිදු වේ. මෙම ගුණ දහම් ගිහි පැවිදි දෙපක්ෂයට ම ටිකින් ටික සම්පූර්ණ කළ හැකි ය. අපේ ජීවිතය වඩාත් වටිනා ජීවිතයක් බවට පත්කර ගැනීමට පාරමිතා උපකාර වේ. දැහැමි වූත් ක්‍රියාශීලී හා මිත්‍රශීලී වූත් ලෞකික සමාජයක් ඇති වීමට ද මෙම ගුණ දහම් උපකාර වේ. මේවා පිරීමේ උසස් ම ප්‍රතිඵලය පිරිනිවනට පත්වීම යි.

දානං සීලං ච නෙක්ඛම්මං
පඤ්ඤා විරියෙන පඤ්චමං,
ඛන්ති සච්චමධිට්ඨානං
මෙත්තුපෙක්ඛාතිමෙ දස.

සාරාංශය

පාරමිතා දසයකි. ඒවා බුද්ධකාරක ධර්ම නමින් ද හැඳින් වේ. තණ්හා මාන දිට්ඨීන්ගෙන් තොර ව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතු ව බුද්ධත්වය පතා පුරන දනාදී ප්‍රතිපත්ති පාරමිතා ය. පාරමිතාවක්, පාරමී උපපාරමී පරමත්ථ පාරමී යනුවෙන් කොටස් තුනකි. මෙම පිළිවෙත් පිරීම ලෞකික ජීවිතයේ සාර්ථකත්වයට ද හේතු වේ.

ක්‍රියාකාරකම්

01. පාරමී යන්නෙහි අර්ථය පාරමී, උපපාරමී, පරමත්ථ පාරමී තුනෙහි වෙනස පැහැදිලි කරන්න.

02. ඛන්ති සහ අධිට්ඨාන පාරමිතා ඔබේ දිවිමග සරුකර ගැනීමට උපකාර වන ආකාරය පහදන්න.

03. එක් එක් පාරමිතාවකට නිදසුන් ලෙස දැක්විය හැකි ජාතක කතා ඇතුළත් වගුවක් පිළියෙල කරන්න.

පැවරුම

01. එක් එක් පාරමිතාවක් හඳුන්වමින් මෙම පාඩමෙහි ඇතුළත් කර ඇති පාලි පාඨයන්හි අර්ථ විමසා දැන ගෙන සටහන් පොතේ ලියන්න.

02. මෙම පාඩමෙහි ඇති 'උම්මග්ග ජාතකයෙන්' යන චිත්‍රය නිරීක්ෂණය කර, එයින් ප්‍රකාශ වන සිද්ධිය සොයා ලිඛිතව ඉදිරිපත් කරන්න.